# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2111/3 – 2019 පෙබරවාරි 18 වැනි සඳුදා – 2019.02.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1985 ඔක්තෝබර් මස 15 වැනි දින අංක 371/12 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පලකරන ලද 1985 අංක 308 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡෙදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 03ජේ/82/යූඩීජ්/89.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: එච්අයිකේ/ඩීඑස්/එල්එන්ඩී/04/02/52.
2019 පෙබරවාරි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව (දකුණ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, හික්කඩුව කොට්ඨාස අංක 2, වැල්ලවත්ත කොට්ඨාස අංක 3, වැල්ලගොඩ හික්කඩුව සුළු නගර සභා සීමාව තුළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගා 2076 හා 1987.07.10 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 11 – බණ්ඩරවත්ත වරි. අංක 95 සහ 97, ගාලු පාර – ප්‍රමාණය: හෙක්. 0.096 ක් පමණ**

උතුරට: සුමනසාර පාර; නැගෙනහිරට: මු. පි. 3646 කැබලි අංක ඒ356; දකුණට: කැබලි අංක 15; බටහිරට: කැබලි අංක 14, 13, 12 සහ එච්. එල්. විලියම් සිංඤෝ සහ තවත් අය හිමිකම් කියන වැල්ල අද්දර මහවත්ත.

03 – 233

1A – G29480 – 26 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*